# පූර්ව මැතිවරණ සමයේ බරපතළ පහරදීම් ඉහළට

ජේ.ටී. ද සිල්වා, දයා පෙරේරා

මෙවර ජනාධිපතිවරණයට අදාළව පූර්ව මැතිවරණ සමයේදී බරපතළ ගණයේ පහරදීම්වල ඉහළ යෑමක් දකින්නට ලැබෙන බව 'පැෆරල්' සංවිධානය කියයි.

දෙසැම්බර් 31 වැනිදා වන විට බරපතළ පහරදීම් 36ක්ද, පහරදීමේ සිදුවීම් 21ක්ද වාර්තාවූ බව තම සංවිධානය පවසයි. 2010 ජනාධිපතිවරණයේ දින හතළිහක පූර්ව මැතිවරණ සමයේදී තහවුරු කරගත් මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සංඛ්‍යාව 572ක් වූ බවද, තහවුරු නොකළ උල්ලංඝනය වීම් 200ක්ද සමඟ මුළු සිදුවීම් සංඛ්‍යාව 757ක් දක්වා ඉහළ ගොස් තිබුණු බවද පෙන්වා දෙන 'පැෆරල්' සංවිධානය මෙවර ජනාධිපතිවරණයට දින 9කට පෙර එනම් දෙසැම්බර් 31 වැනිදා වාර්තා වූ සිදුවීම් ගණන 550 ඉක්මවා ඇති බවද සඳහන් කරයි.

2010 ජනාධිපතිවරණයේදී මනුෂ්‍ය ඝාතන 4ක් වාර්තා වී යැයිද පැෆරල් සංවිධානය කියයි.